# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2019 මැයි මස 17 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2019.05.17 දින නිකුත් කරන ලදී)**


## පළාත් සභා (සංශෝධන)

**1987 අංක 42 දරන පළාත් සභා පනත සංශෝධනය**
**කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගේ
නියමය පරිදි පළ කරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 6.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය*** : මේ වගන්තිය මඟින් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 19 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතියේ බලපෑම වනුයේ (252 වන අධිකාරය වූ) මහනගර සභා ආඥාපනතේ, (255 වන අධිකාරය වූ) නගර සභා ආඥාපනතේ සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ ලැබීම් හැර, පළාත් සභාවල වෙනත් සියලු ලැබීම් පළාත් අරමුදලට ගෙවීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

එල්.ඩී.—ඕ. 64/2016

## 1987 අංක 42 දරන පළාත් සභා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2019 අංක       දරන පළාත් සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1987 අංක 42 දරන පනතේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම.

**2.** 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 19 වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(ඇ) පිළිවෙළින් (252 වන අධිකාරය වූ) මහනගර සභා ආඥාපනත, (255 වන අධිකාරය වූ) නගර සභා ආඥාපනත සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ මහනගර සභාවල, නගර සභාවල සහ ප්‍රාදේශීය සභාවල ලැබීම් හැර පළාත් සභාවේ වෙනත් සියලු ලැබීම්.".

අනනුකූලතාවක් ඇති වූ විට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.